**ශීර්ෂය 317 - උතුරු මැද පළාත් සභාව**

**1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය**

**1.1 දැක්ම**

පිරිපුන් පළාතක්

**1.2 මෙහෙවර**

ධරණීය සමමිතික සහ සාර්ව සංවර්ධන ප්‍රවේශයකින් පළාත් සංවර්ධනය ප්‍රමුඛ කරගත් ජාතික සංවර්ධනයට සෘජු හා අඛණ්ඩ ලෙස දායක වීම.

**1.3 කාර්භාරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයයන් ඉටු කිරීම.

**2. මූල්‍ය ප්‍රකාශන**

**මුළු ප්‍රතිපාදන හා වියදම**

උතුරු මැද පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 19,013.13 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.මිලියන 17,598.21 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පළාත් සභාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදයෙන් රු.මිලියන 1,414.91 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | **2018 දෙසැම්බර් 31 දිනට** | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 15,354.62 | 15,354.62 | - | - |
| මූලධන | 3,658.50 | 2,243.59 | 1,414.91 | 38.67 |
| **එකතුව** | **19,013.12** | **17,598.21** | **1,414.91** | **7.44** |

**3. විගණන නිරීක්ෂණය**

ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදුකර තිබුණි. පළාත් සභාවේ අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.